# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1552/11 - 2008 ජුනි 03 වැනි අඟහරුවාදා - 2008.06.03

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 2 දරන ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍ය, අහමඩ් ලෙබ්බේ මරික්කාර් අතාඋල්ලා වන මම, එකී මණ්ඩලයට නුවරඑළිය දිස්ත්‍රික් සමූහ ජල සම්පාදන ව්‍යාපෘතියේ ගිනිගත්හේන ජල සම්පාදන ක්‍රමයේ ලොනැක් ජල මූලාශ්‍රයේ සිට සම්ප්‍රේෂණ නල එළීම හා නඩත්තු කිරීම සඳහා ඉඩම් කොටසක් අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ පරවශතා අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

අහමඩ් ලෙබ්බේ මරික්කාර් අතාඋල්ලා,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2008 මැයි මස 29 වැනි දින,
අංක 34, නාරාහේන්පිට පාර, නාවල.
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/832.

### උපලේඛනය

නුවරඑළිය දිස්ත්‍රික්කයේ, අඹගමුව කෝරළේ, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 320P වැලිඔය ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, ලොනැක් වත්ත ගමේ පිහිටි ලොනැක් වත්ත නමැති ඉඩමෙන් පර්චස් 38.4 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස.

*උතුරට* : වටවල වැවිලි සමාගම හිමිකම් කියන ලොනැක් වත්ත ;
*නැගෙනහිරට* : වටවල වැවිලි සමාගම හිමිකම් කියන ලොනැක් වත්ත ;
*දකුණට* : වටවල වැවිලි සමාගම හිමිකම් කියන ලොනැක් වත්ත ;
*බටහිරට* : වටවල වැවිලි සමාගම හිමිකම් කියන ලොනැක් වත්ත.

හිමිකම් කියන්නන්ගේ නම හා ලිපිනය : 01. සීමාසහිත වටවල වැවිලි සමාගම,
අංක 60, ධර්මපාල මාවත,
කොළඹ 03.

06 -308

1A - G 009818- 440 (2008/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.